
# ගුරු වෘත්තීය සංවර්ධනය සඳහා කාර්යමූලික පර්යේෂණ

## ගුරු අධ්‍යාපනඥයින් සහ පාසල් ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය




අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය
ශාස්ත්‍ර පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ගුරු වෘත්තිය සංවර්ධනය සඳහා කාර්යමූලික පර්යේෂණ
ගුරු අධ්‍යාපනඥයින් සහ පාසල් ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය

Action Research for Professional Development
Guide for Teacher Educators and School Teachers

---

© ආචාර්ය ප්‍රසාද් සේතුංග 2009
අංශාධිපති, අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය
(ප්‍රධාන පර්යේෂක - කාර්යමූලික පර්යේෂණ 2008/2009)

---

පරිගණක සැකසුම : ගිහාන් උදලාගම

---

ප්‍රකාශනය: අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය,
ශාස්ත්‍ර පීඨය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## පටුන

1. හැඳින්වීම 03

2. උපදෙස් සංග්‍රහය භාවිතා කිරීම 04

3. කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය හා වෘත්තීය සංවර්ධනය 05

4. කාර්යමූලික පර්යේෂණ සඳහා නිර්වචන 06

5. කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදයෙහි ප්‍රධාන ලක්ෂණ සහ සර්පිලාකාර චක්‍රය 08

6. අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යමූලික පර්යේෂණ ප්‍රවේශයන් ගේ සම්ප්‍රදායයන් 12

7. කාර්යමූලික පර්යේෂණය ක්‍රියාත්මක කිරීම 14

8. කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව පර්යේෂකයන්ගේ ඇසින්... 21

9. ආශ්‍රිත ග්‍රන්ථ 31

# හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය විසින් 2001 වසරේ සිට පශ්චාත් උපාධි අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නියමිත අර්ධ පර්යේෂණ නිබන්ධනය (Part Dissertation) සඳහා කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය හඳුන්වාදෙන ලදි.
ගුරුවෘත්තිකයින් කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය වෙත යොමු කිරීමේ එම දීර්ඝ කාලීන වූ අත්දැකීම මත අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශයෙහි ආචාර්ය මණ්ඩලය විසින් 2008 සහ 2009 වර්ෂ වලදී ලෝක බැංකු ආධාර යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක වන අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන යටතේ නවක ගුරුවරුන්ගේ වෘත්තිය සංවර්ධනය තුලින් පාසල් ප්‍රවර්ධනය සඳහා සාමූහික කාර්යමූලික පර්යේෂණයක් දියත් කරන ලදි. මධ්‍යම පළාත තුල 2005/06 වසර වලදී පාසල් අධ්‍යාපන පද්ධතියට එක්වූ නවක උපාධිධාරී ගුරුවරුන්ගෙන් වැඩි පිරිසක් යොමු කරන ලද තෙල්දෙණිය අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් හා අත්වැල් බැඳගත් අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශයෙහි ආචාර්ය මණ්ඩලය ඒ ඒ පාසල් වල ප්‍රවර්ධනය උදෙසා එම ගුරුවරුන් විසින්ම හඳුනාගත් ගැටළු විසඳීමට කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය සාමූහිකව ක්‍රියාත්මක කරන ලදි.
අධ්‍යාපනපති පාඨමාලාවේ ගුරු සිසුන් සඳහා නිර්දේශිත පර්යේෂණ ව්‍යාපෘති සඳහා ද කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනීම 2009/2010 පාඨමාලාව සඳහා අත්හදා බැලීමක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය ඉහත සඳහන් කාර්යමූලික පර්යේෂණ පිළිබඳ අත්දැකීම් වල ප්‍රතිඵලයකි.

අප ආචාර්ය මණඩලය විසින් ලද එම ප්‍රයෝගික පර්යේෂණ අත්දැකීම, ප්‍රත්‍යාවේක්ෂණය හෙවත් අවලෝකනය (Reflection) තුලින් තම වෘත්තීය හැකියාවන් දියුණු කරගැනීමෙහිලා කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදයෙහි ඇති වැදගත්කම තවතවත් අපවෙත පසක් කරන්නට හේතු වූ බව නොකිව මනාය.

## උපදෙස් සංග්‍රහය භාවිතා කිරීම

ගුරු අධ්‍යාපනඥයින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා නියැලෙන වෘත්තිකයින් වේ. ගුරුවරයාට අධ්‍යාපනය (Teacher Education) ලබාදීමේ කාර්යය වර්තමානයේ ගුරුවරයා සංවර්ධනය (Teacher Development) කිරීමේ පුළුල් ක්‍රියාවලියක් බවට විකාශය වී ඇත.

ගුරුවරයාගේ සංවර්ධනය අරමුණු කරගෙන දියත් කෙරෙන විවිධ කාර්යයන් අතර ගුරුවරුන් කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය සඳහා යොමුකිරීම දශක කීපයකට පෙර සිටම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බහුලව භාවිතා කෙරෙන කාර්යයකි.

එම කාර්යය ඵලදායීව සිදුකිරීම සඳහා මෙම පොත ප්‍රායෝගික අත්වැලක් වන අයුරින් සූදානම් කර ඇති අතර ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයට උරදෙන ගුරු අධ්‍යාපනඥයින්ට සහ තම වෘත්තීය සංවර්ධනය සඳහා අත්හදා බැලීම් වල යෙදෙන විවිධ ගුරුවරුන් සඳහා මෙය වඩා ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම උපදෙස් සංග්‍රහය ගුරුවරුන් සඳහා පැවැත්වෙන කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ කාර්යයේදී ක්‍රියාකාරකම් පාදක කොටගත් ඉගැන්වීම් ශෛලියකට උචිත වන අයුරින් ඉදිරිපත් කර ඇත. මෙහි අන්තර්ගත වී ඇති උපදෙස් භාවිතා කිරීමේදී ගුරුවරයාව නිත්‍ය වශයෙන්ම පොතෙහි සඳහන් ප්‍රධාන මූලාශ්‍ර වෙත යොමුකිරීම සිදු කළයුතු වේ.

වෘත්තීය ජීවිතයේ වැඩි කාලයක් ඉගැන්වීමේ කාර්යයෙහිම යෙදෙන ගුරුවරයාට කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදයෙහි ස්වභාවය හා සුවිශේෂ ලක්ෂණ පිළිබඳව ප්‍රායෝගිකව අවබෝධ කරගැනීමට කිසියම් කාලයක් අවශ්‍යවේ.මෙම ක්‍රමවේදය අවබෝධ කරගැනීමේ ඵලදායී උපක්‍රමය වන්නේ ද ප්‍රායෝගිකව කාර්යමූලික පර්යේෂණ ක්‍රියාවලියෙහි යෙදීම වේ. එම ක්‍රියාවලිය පහසුවෙන් අවබෝධ කරගැනීම සඳහා මෙම අත්පොත අමතර ඉගෙනුම් ඉගැන්වීම් ආධාරකයක් ලෙස භාවිතා කිරීම සුදුසු වේ.

## කාර්යමූලික පර්යේෂණ ක්‍රම වේදය හා වෘත්තීය සංවර්ධනය

ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා කෙටි කාලීන වශයෙන් විවිධ පාඨමාලා පැවැත්වේ. ඒ අතර වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සේවාස්ථ සැසි උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

ගුරුවරුන් සඳහා වූ සමහර වෘත්තීය සංවර්ධන වැඩසටහන් ගුරුවරුන්ගේ කාලය අපතේ යවමින් ඔවුන්ව තවත් පීඩනයට ලක් කරන ඒවා බවට පත් වී ඇත. තවද ගුරුවරුන් තම වෘත්තීය අත්දැකීම් හුවමාරු කරගන්නා ක්‍රියාකාරකම් දැකිය හැක්කේද බොහෝ අඩු වශයෙනි. ඊට හේතු වශයෙන් වෘත්තීය තුලදී මතුවන විවිධ ගැටළු, ප්‍රශ්න, අදහස්, සිතුවිලි හුවමාරුකරගන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩි සැලකිල්ලක් නොදැක්වීම, පාසල් කාලයෙන් පිටතදී සමවයසේ වෘත්තීය සගයන් සමග වෘත්තීය සම්බන්ධතා නොතිබීම, කාලය නොමැතිකම ආදිය පර්යේෂණ සාහිත්‍යයේද සඳහන් වේ.
ඉහත තත්වය අප රටේ ගුරුවරුන්ටද මදක් හෝ අදාල වේ යයි කිවහොත් ඔබද ඊට එකඟ වනු ඇත.

පසුගිය තිස් වසරක කාල සීමාව තුල ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා කාර්යමූලික පර්යේෂණ යොදාගැනීම සාමාන්‍ය දෙයක් බවට පත්වී ඇත (Yoon, Park & Hong, 1999). කාර්යමූලික පර්යේෂණ විධිමත් පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස ක්ෂේත්‍රයට එක්වී දැනට වසර 70 කට අඩු කාලයක් ගත වුවද සමහර ගුරුවරුන් අවිධිමත් ආකාරයෙන් ගුරුවරයෙක් වශයෙන් සේවයෙහි යෙදෙන කාලය තුල කාර්ය මූලික පර්යේෂණ අවධීන්ට අදාල ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇත. ස්වයං අවලෝකනයහි යෙදෙන ගුරුවරයා තම පන්ති කාමරයට ඇස යොමු කර විවිධ විමසීම් සහ අත්හදා බැලීම් තුලින් තම ඉගැන්වීම් ව්‍යවහාරයන් වර්ධනය කරගැනීමෙහිලා යොමුවෙයි. කාර්ය මූලික පර්යේෂණයකින් ළගා කර ගැනීමට බලා පොරොත්තු වන්නේද එවැනිම අරමුණකි.

## කාර්යමූලික පර්යේෂණ සඳහා නිර්වචන

අධ්‍යාපනික කාර්යමූලික පර්යේෂණය පන්ති කාමරයක් තුල හෝ පාසල් ප්‍රජාව තුල කෙරෙන විධිමත් පරීක්ෂණ දෙකකින් සමන්විත වේ. එනම්, වෘත්තීය අවලෝකනය සහ පර්යේෂණ පාදක කරගත් ව්‍යවහාර භාවිතා කිරීම වේ (Shumack, 2009). තවද එම පරීක්ෂණ තම වෘත්තීය කාර්යයන්ගේ ප්‍රථිඵල වල ඵලදායීතාවය ඉහල නැංවීමේ අරමුණින් යමෙකු විසින් අත්හදා බලන නව ව්‍යවහාරයන් වේ.

කාර්යමූලික පර්යේෂණයක් යනු සැබෑ තත්වය වර්ධනය කිරීම සහ වෙනස් කිරීම සඳහා යොදාගත හැකි ප්‍රබල උපකරණයකි (Cohen et al., 2000:226).

කාර්යමූලික පර්යේෂණය නිත්‍ය වශයෙන්ම ගැටළු විසඳීම සඳහා සර්පිලාකාර වූ චක්‍රයකින් සිදු කරන ප්‍රායෝගික ක්‍රියාවලියකි. එම ස්වභාවය මත මෙම පර්යේෂණ ක්‍රමවේදය දෙස බලන විට කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය ක්‍රියාවට නංවන පර්යේෂකයා එදිනෙදා වෘත්තීය ජීවිතයේ කිසියම් වෙනසක් ඇති කිරීම සඳහා වෙර දරන්නෙකි (Gray, 2004:374).

ගුරු වෘත්තියෙහි නියැලී සිටින අපට කාර්යමූලික පර්යේෂණයක් සඳහා යොමුවීම තුලින් අප වෘත්තියෙහි සැබෑ තත්වයට හොඳින්ම සම්බන්ධවිය හැකි වේ. ඒ නිසාවෙන්ම තම වෘත්තීය අත්දැකීම් හා අදාල වූ පර්යේෂණ ක්‍රියාවලියෙහි ප්‍රථිඵල වෙනස් අවස්ථාවන් සඳහා ඒ ආකාරයෙන්ම යොදාගෙන සාමාන්‍යකරණයක් කිරීම අපහසු වේ. ඇත්තෙන්ම කාර්යමූලික පර්යේෂණයක් ක්‍රියාත්මක වීම තුලින් සිදුවන්නේ පවතින සැබෑ තත්වය වෙනසකට බඳුන් කිරීම සඳහා කෙරෙන බලපෑමකි.

එම බලපෑම තම වෘත්තීය ජීවිතය තුල ඉතා පුළුල් ආකාරයෙන් යොදා ගත හැකි අතර තනිව හෝ කණ්ඩායමක් ලෙස, පන්ති කාමරයක් හෝ අංශයක් ලෙස, පාසලක් හෝ පාසල් සමූහයක් ලෙස ක්‍රියාත්මක කළ හැකිය.

2000 වසරෙහි ප්‍රකාශිත Cohen ඇතුළු පර්යේෂණ කණ්ඩායමෙහි අනාවරණ වලට අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යමූලික පර්යේෂණ යොදා ගත හැකි අවස්ථා පිළිබඳ ලැයිස්තුවක් යෝජනා වී ඇත එනම්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද වෙනස් කිරීම සඳහා, ශිෂ්‍යයින්ගේ සාරධර්ම, ආකල්ප සහ හැසිරීම් රටාවන් වෙනස් කිරීම හෝ වර්ධනය කිරීම සඳහා, පාසල තුල ඵලදායී කළමනාකරණ ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා ආදිය වේ. තවද එම පර්යේෂණ යෝජනා වලට අනුව කාර්ය මූලික පර්යේෂණ ක්‍රමවේදය වෘත්තීය සංවර්ධනය තව තවත් වැඩි දියුණු කිරීම සඳහා ඉතා ප්‍රයෝජනවත් වූ ක්‍රමවේදයක් ලෙස අවධාරණය වී ඇති අතර කාර්යමූලික පර්යේෂණ අප වැඩ කරන පරිසරය පිළිබඳව අපට හොඳ අවබෝධයක් ඇති කර ගැනීමට, අපතුල කිසියම් පෙළඹවීමක් ඇති කිරීමට සහ ස්වයං අවලෝකනයකට මග හෙළිපෙහෙළි කරන උත්තේජකයකි.

කාර්යමූලික පර්යේෂණයක් හා සාම්ප්‍රදායක පර්යේෂණයක් අතර ඇති වෙනස්කම්.


| සංසන්දනාත්මක මූලිකාංගය | කාර්යමූලික පර්යේෂණ | සාම්ප්‍රදායික පර්යේෂණ |
|---|---|---|
| පර්යේෂකයා | ගුරුවරයා විසින්ම පර්යේෂණය දියත් කරනු ලබයි | ගුරුවරයාම විය යුතු නැති අතර. වෙනත් කෙනෙක් විය හැක |
| අවස්ථාව | සැබෑ තත්වය (දේශීය) | ජාත්‍යන්තර |
| නාභිගත කරන ගැටළුව | සුවිශේෂ ගැටළුවකි | සාමාන්‍ය ගැටළුවකි |
| නියැදිය | බොහෝ දුරට සමස්ථ පර්යේෂණ ජනගහනයම අධ්‍යයනය කෙරේ | නියැදිය පමණක් අධ්‍යයනය කෙරේ |
| අනාවරණ යොදාගැනීම | සැණින් යොදා ගනියි | යොදාගැනීමේ කාලසීමාවක් නැත |

## කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදයෙහි මූලික ලක්ෂණ සහ සර්පිලාකාර චක්‍රය


කාර්යමූලික පර්යේෂණ ක්‍රියාවලියෙහි ප්‍රධානතම ලක්‍ෂණයක් වන්නේ පර්යේෂණය චක්‍රාකාරව හෙවත් සර්පිලාකාරයෙන් සිදුවිය යුතු වීමයි. 1948 වසරේදී Kurt Lewin විසින් ඉදිරිපත් කරන ලද මෙම සර්පිලාකාර වූ පර්යේෂණ ක්‍රියාවලිය Lewin ට පසුකාලීනව විවිධ පර්යේෂකයින් විසින් තම ප්‍රායෝගික කාර්යමූලික පර්යේෂණ අත්දැකීම් තුළින් පැහැදිලි කිරීමට සමත් වී ඇත.


**ක්‍රියාකාරකම අංක 01**

ඉහත ඉදිරිපත් කරන ලද නිර්වචන පිළිබඳ අන්තර්ගතය වැඩිදුරටත් අවබෝධ කරගැනීම සඳහා පහත සඳහන් රූප සටහන් යොදාගත හැකිය.




## කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදයට ආවේණික වූ චක්‍රාකාර හෝ සර්පිලාකාර ක්‍රියාවලිය




McNiff (1988, p 27) gives an example using the model proposed by Kemmis and McTaggart (1982) to illustrate this aspect:

කාර්යමූලික පර්යේෂණ ක්‍රියාවලිය මේසයක් මත හිඳගෙන පත්‍රිකාවක් උඩ කිරීම නම් ඉතා පහසුය. ඇත්තම තත්වය නම් වෘත්තීය ජීවිතය මහත් සංකීර්ණ වූවක් නිසා ඉහත සැලසුම් සහගත චක්‍රාකාර ක්‍රියාවලිය ඒ ආකාරයෙන්ම සිදු කිරීම අපහසු වීමයි. කෙතරම් සූක්ෂම වූත් මනා සැලසුමකින් යුතු ක්‍රියාමාර්ගයන්ගෙන් පර්යේෂණය ඇරඹුවද එම ක්‍රියාවලියෙහි ස්වභාවයට අනුව ප්‍රතිඵල පිළිබඳව විශ්වාස කළ නොහැක. උක්ත සංකීර්ණ බව නිසා ක්‍රියාවලිය අතර තුරදී මතුවන බලාපොරොත්තු නොවූ විවිධ සංසිද්ධීන් සැලසුම්සහගත වූ චක්‍රාකාර හෝ සර්පිලාකාර ගමන් මග වෙනස් කරනු ලබයි. වෙනස් කිරීමට සිදුවන එම ගමන් මග Whitehead (1998) නැමති පර්යේෂකයා කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදයේ "අවුල් සහගත ස්වභාවය" (messiness) ලෙස විස්තර කරන අතර පහත රූපසටහනෙහි දැක්වෙන ආකාරයෙන් සර්පිල මත තව තවත් සර්පිල ඇති විය හැකි ආකාරය විදහා දක්වයි.



**Key text**: McNiff, J. (1988) *Action Research: Principles and Practice*, Basingstoke, Macmillan

**ක්‍රියාකාරකම අංක 02**

ප්‍රශ්න නගා පිළිතුර සාකච්ඡා කරන්න.

a. කාර්ය මූලික පර්යේෂණයක් යනු කුමක්ද?

   ගුරු වෘත්තිකයා මූලිකව ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ ක්‍රමවේදයක් (Teacher Research)

b. ගුරුවරයෙක් වශයෙන් මම කාර්යමූලික පර්යේෂණයක යෙදෙන්නේ ඇයි?

   ශිෂ්‍යයින්ගේ ඉගෙනීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමට
   අවලෝකනය තුලින් වෘත්තිය පිළිබඳව ඉගෙනීමෙහි යෙදෙන ගුරුවරයෙක් ලෙස වෘත්තීය හැකියා සංවර්ධනය කරගැනීමට

c. කාර්ය මූලික පර්යේෂණයක් යනුවෙන් හඳුන්වන්නේ කුමන ආකාරයේ ක්‍රියාකාරකමකටද?

   තමන්ගේ ඉගැන්වීමක් හෝ ඉගැන්වීම් ව්‍යවහාරයන්ට වෙනසක් ලබාදීමේ උවමනාව පෙරදැරි කොටගෙන එම ව්‍යවහාරයන් තුළ ගැටළුවක් සොයාගෙන ඊට විසඳුම් ලබාදීමට ක්‍රියාත්මක වීම

**කාර්ය මූලික පර්යේෂණයක් යනු කුමක්ද? විවිධ නිර්වචන තුලින් හඳුනා ගනිමු**

**ක්‍රියාකාරකම අංක 03**

a. දී ඇති නිර්වචන එකට වාඩිවී සිටින කෙනෙකු සමග හෝ කණ්ඩායමක් සමග සන්සන්දනය කරන්න.


b. ඒ ඒ නිර්වචන සඳහා ප්‍රශ්න දෙක බැගින් සූදානම් කරන්න.
   උදා: සර්පිලාකාර චක්‍රයක් යනුවෙන් සඳහන් කර ඇත්තේ චක්‍ර කීපයක් ක්‍රියාත්මක වන නිසාද?

c. b යටතේ සූදානම් කරන ලද ප්‍රශ්න දෙකෙන් එක් ප්‍රශ්නයක් සහෘදයාට යොමුකර අනෙක් ප්‍රශ්නය දේශකවරයාට / දේශකවරිය වෙත යොමුකර සාකච්ඡා කරන්න.

උදා: කාර්යමූලික පර්යේෂණ ක්‍රියාවලිය සෑමවිටම සර්පිලාකාර හෝ චක්‍රාකාර වියුතුද?

## අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යමූලික පර්යේෂණ ප්‍රවේශයන්ගේ සම්ප්‍රදායයන්

බටහිර රටවල් කිහිපයකින් ඉදිරිපත් වී ඇති මූලික සම්ප්‍රදායයන්




**(Shumuck, 2009: 25.26)**

**ක්‍රියාකාරකම 04**

a. ඉදිරිපත් කරන ලද සම්ප්‍රදායයන් 5 වෙත ගුරුවරුන්ගේ අවධානය යොමු කරවන්න. (පුස්තකාල, වෙබ් අඩවි, සහ "Educational Action Research"වැනි ශාස්ත්‍රීය පර්යේෂණ සඟරා වෙත යොමු කරවන්න.)

b. ඉහත සම්ප්‍රදායයන් ගෙන් තමන් විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන කාර්යමූලික පර්යේෂණය සමග වඩා ගැලපෙන සම්ප්‍රදාය කුමක්ද? යන්න විමසීමට යොමුකරවන්න.

c. ඉහත a. b. යන කාර්යයන් වල නිරත කරවීම තුලින් ගුරුවරයාව පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය යන පර්යේෂණ අත්දැකීම ලබා ගන්නා ආකාරය පිලිබඳව සාකච්ජා කරන්න.

## කාර්යමූලික පර්යේෂණය ක්‍රියාත්මක කිරීම

කාර්යමූලික පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීමේ දුෂ්කර කාර්යය වන්නේ සාම්ප්‍රදායික පර්යේෂණයකදී මෙන් පර්යේෂණ ප්‍රශ්න පෙර සිටම සූදානම් කරගෙන එම පර්යේෂණ ප්‍රශ්න මූලික කරගෙන ඒ සම්බන්ධව රැස්කරගත් දත්ත තොරතුරු ආශ්‍රිතව ලියන සාම්ප්‍රදායික රටාව නොවන නිසාය.

කාර්යමූලික පර්යේෂණයක දී පර්යේෂණ ක්‍රියාකාරකම ආරම්භ වන්නේ ඔබ මොනයම් හෝ අදාල ක්‍රියාවක යෙදෙන විටදී ඔබ බලාපොරොත්තු නොවූ දෙයක් සිදුවන විට එම සිදුවීම හෝ තත්වය පිළිබඳව විමසිලිමත් වී ඔබට ඒ පිළිබඳව දැනීමට පටන්ගත් විටදී ය.

කාර්යමූලික පර්යේෂණයක් ආරම්භ කිරීමේ දී අති දුෂ්කරම කාර්යය වන්නේ තමා තවම කුමන පර්යේෂණ කාර්යයක් සඳහා විමසිලිමත් වන්නේ ද යන්න පැහැදිලි අදහසක නොමැති අවස්ථාවක කිසියම් විෂයයකට හෝ මාතෘකාවකට අදාලව සිදුවන්නේ කුමක්දැයි වාර්තාකරණයෙහි හෝ නිරීක්ෂණයෙහි යෙදෙන විටදීය.

සාම්ප්‍රදායික පර්යේෂණයක දී මෙන් කාර්යමූලික පර්යේෂණය, පර්යේෂණ ප්‍රශ්නයකින් ආරම්භ නොවන අතර තමා සුපුරුදු කාර්යයන් හි යෙදෙන කිසියම් දිනක සාමාන්‍යයෙන් සිදුවන දෙයට වඩා වෙනසක් සිදුවන බව දැනුන විටය. උදාහරණයක් ලෙස සැමදා පහළට ගලන ගඟ අද ගලන්නේ වෙනස් ආකාරයකට සුළි නඟමින් යනාදී ලෙස ඔබට දැනුන අවස්ථාවක බව දැක්විය හැකිය.

### සැලසුම් කිරීම

කාර්යමූලික පර්යේෂණය සැලසුම් කරන අවධියේදී හෝ කිසියම් වෘත්තීය ගැටළුවක් සඳහා පර්යේෂකයා නාභිගත කරවීමේදී පහත සඳහන් ක්‍රියාකාරකම යොදා ගත හැකිය.

පහත ක්‍රියාකාරකම් කාර්ය මූලික පර්යේෂණ හැඳින්වීම හා නිර්වචන පිලිබඳ සැසි වලට පසුව කාර්ය මූලික පර්යේෂණය ක්‍රියාත්මක කරන මුල් අවධියේදී ක්‍රියාත්මක කිරීම උචිත වේ.

**ක්‍රියාකාරකම අංක 05**

කාර්ය මූලික පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන මූලික අවස්ථාවේදී තමන් වෙතම යොමු කළ යුතු ප්‍රශ්න

ප්‍රශ්න නගා පිළිතුර සාකච්ඡා කරමු.

- මම ගැටළුවක් ලෙස දකින්නේ කුමක්ද?
- ගැටළුවක් ලෙස මෙය ඉදිරිපත් කිරීම සඳහා මට එක් කරගත හැකි සාක්ෂි මොනවාද?
- එම ගැටළුව සඳහා විසඳුම ලෙස මම දකින්නේ කුමක්ද?
- එම ගැටලුව සඳහා මම විසඳුම ක්‍රියාත්මක කරන්නේ කෙසේද?
- ගැටළුව සඳහා වූ ප්‍රථිඵල මා ඇගයීමට ලක් කරන්නේ කෙසේද?
- ඉන්පසුව මම ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

**ක්‍රියාකාරකම අංක 06**

පළමුව තනි තනිව පහත ප්‍රශ්න වලට ඔව් යන පිළිතුර දිය හැකි දැයි බලන ලෙස ගුරුවරුන්ට දන්වන්න.

පිළිතුර කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කරවන්න.

කණ්ඩායම් සාකච්ජාව පැවැත්වෙන අතරතුර කණ්ඩායම් වෙත ගොස් "නැත" යන පිළිතුර දී ඇති ගුරුවරුන් කිපදෙනෙක් වෙත ප්‍රතිපෝෂණයක් ලබා දෙන්න.

| | ඔව් | නැත |
|---|---|---|
| තෝරාගත් ගැටළුව මට වැදගත් වන අතර මම එම ගැටළුව පිළිබඳව සැහීමකට පත්වන්නේද?<br><br>එම ගැටළුව හා සම්බන්ධව මට කිසියම් වෙනසක් ඇතිකිරීමට කාලය තිබේද? | | |

| | | |
|---|---|---|
| එම ගැටළුව විසඳීමේදී අවශ්‍ය සම්පත් මට තිබේද?<br><br>ගැටළුවට අදාල සහභාගිවන්නන් (ශිෂ්‍යයින් සහෘද ගුරුවරුන්) හා සම්බන්ධ වීමේ අවස්ථා තිබේද?<br><br>ඵලදායී වෙනසක් ඇති කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳව මාතුල කිසියම් අදහසක් තිබේද? | | |

**ක්‍රියාකිරීම, නිරීක්ෂණය සහ ප්‍රත්‍යවේක්ෂණය**

කාර්යමූලික පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීමේදී වැදගත්ම මූලිකාංග තුනක් ලෙස ක්‍රියාකිරීම, නිරීක්ෂණය සහ ප්‍රත්‍යවේක්ෂණය දැක්විය හැකිය. මෙම ලක්ෂණ වල සවභාවය පිළිබඳව නිර්වචන සහ සර්පිලාකාර චක්‍රය පිළිබඳ සාකච්ජා වලදීද අවබෝධ වන්නට ඇත.

කාර්යමූලික පර්යේෂණය සැලසුම් කරන අවධියේදී පර්යේෂණ ගැටළුව නාභිගත වී ඇතිනම් ඊ ළඟ අවධිය වන්නේ ගැටළුවට විසඳුම බලාපොරොත්තුවෙන් ඔබ කුමන ආකාරයෙන් ක්‍රියා මාර්ග ගැනීමට තීරණය කරන්නේද? එම ක්‍රියා මාර්ග සඳහා දත්ත රැස් කර ගන්නේ කෙසේද? යන්න පිළිබඳව සිතන අවධියයි.

උදාහරණයක් ලෙස සම්මුඛ සාකච්ජා, නිරීක්ෂණ, වීඩියෝ පටිගත කිරීම් සහ තොරතුරු විශ්ලේෂණය ආදී පර්යේෂණ උපකරණ රැසක් දත්ත රැස්කිරීමේදී පර්යේෂකයාට උපයෝගී කරගත හැක.

දත්ත රැස් කිරීමේදී භාවිතා කරන පර්යේෂණ උපකරණ තෝරා ගැනීමේදී  වැදගත්ම මූලිකාංගය වන්නේ එම උපකරණ අරමුණ හා හොඳින් ගැලපී තිබිය යුතු වීමයි.

ඔබ පර්යේෂණයට සූදානම් වී තොරතුරු රැස් කරන අවධියේදී දිය යුතු වැදගත් උපදේශයක් වන්නේ ඔබේ පර්යේෂණ කාර්යය සඳහා කාර්ය සැලැස්මක් සහිත පර්යේෂණ යෝජනාවලියක් සකසා ගැනීම කලයුතු

බවයි. තම පර්යේෂණයට නාභිගත වීමේ පියවර සහ කාර්ය සැලැස්ම, පර්යේෂණ යෝජනාවලිය සඳහා පහත දී ඇති ආකෘතීන් උදවු කරගත හැක.

පර්යේෂණයට නාභිගත වීමේ පියවර ආකෘතිය

ගැටළුව පිළිබඳ අදහස

↓

එම ගැටළුවට මා යොමු වූයේ ඇයි ?

↓

පර්යේෂණ සාහිත්‍යය විමසීම්

↓

බුද්ධි කලම්හනය

↓

මූලික පර්යේෂණ ප්‍රශ්න හඳුනා ගැනීම(මගේ ගැටළුව විසඳාගැනීම හා සම්බන්ධ අදහස් වලට උදවු කරගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි මොනවාද?

↓

සුදුසු ක්‍රියාමාර්ග සහ උපකල්පනය කරන විසඳුම්

↓

සුදුසු පර්යේෂණ උපකරණ

↓

කාර්ය සැලසුම සහිත පර්යේෂණ යෝජනාව

↓

(Taylor et al., 2006:8)

කාර්ය සැලැස්ම සඳහා ආකෘතිය

| සති ය | පියවර | ක්‍රියාකාරකම | කාලය | සටහන |
|---|---|---|---|---|
| 1 | ගැටළුව හඳුනා ගැනීම | පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය | දින 2යි | පුස්තකාල භාවිතය |
| 2 | | අවශ්‍ය වීඩියෝ පටිගත කිරීමේ උපකරණ ආදිය සූදානම් කිරීම, දෙමව්පියන් දැනුවත් කිරීමේ ලිපි සහ අදාල පුද්ගලයිගෙන් අවසර ලබා ගැනීම | දින 3යි | අංශභාර/ විදුහල්පති සමග සාකච්ඡා |
| 3 | පර්යේෂණය ආරම්භ කිරීම | ගැටළුව ආශ්‍රිත මූලික නිරීක්ෂණය | මිනිත්තු20 | |
| 4 | | පර්යේෂණ යෝජනාව ලිවීම, නිරීක්ෂණ ෂෙඩියුල සහ ප්‍රශ්නාවලි සැකසීම | දින 3යි | ප්‍රමාණවත් පිටපත් |
| 5 | කාර්යමූලික පර්යේෂණ චක්‍රය 1 | ක්‍රියාකාරකම පිළිබඳ අදාල කණ්ඩායම දැනුවත් කිරීම<br><br>දිනපතා නිරීක්ෂණය<br><br>නිරීක්ෂණ වාර්තා ලිවීම/විශ්ලේෂනය/ පර්යේෂණ සාහිත්‍යය විමසීම/ප්‍රශ්නාවලි ලබාදීම | මිනිත්තු20<br><br>මිනිත්තු 5X10<br><br>පැය 3 | වීඩියෝ පටිගත කිරීම?<br><br>අන්තර්ජාල සෙවීම්? |

| | | | | |
|---|---|---|---|---|
| 6 | කාර්යමූලික පර්යේෂණ චක්‍රය 2 | මූලික ක්‍රියාකාරකම් අදාල කණ්ඩායම සමග ක්‍රියාත්මක කිරීම.<br><br>දිනපතා නිරීක්ෂණය,<br><br>වාර්තා තබා ගැනීම/ විශ්ලේෂණය, පර්යේෂණ සාහිත්‍ය විමසීම, අදාල පුද්ගලයින් සමග සම්මුඛ සාකච්ජා | මිනිත්තු20<br><br>මිනිත්තු 5X10<br><br>පැය 3 | වීඩියෝ පටිගත කිරීම?<br><br>ජායාරූප?<br><br>පටිගත කිරීම්? |
| 7 | කාර්යමූලික පර්යේෂණ චක්‍රය 3 | පර්යේෂණ චක්‍ර 1 හා 2 හි ඇතුලත් ක්‍රියාකාරකම් නැවත ක්‍රියාත්මක කිරීම හෝ වෙනස් කර ක්‍රියාත්මක කිරීම රැස්කරගත් තොරතුරු දත්ත මත තීරණය කල හැකිය.<br>ක්‍රියාව - ප්‍රත්‍යවේක්ෂණය - යොදාගැනීම - ඇගයීම - නැවත ක්‍රියාත්මක කිරීම යන චක්‍රය වාරකීයක් සිදු කලයුතුද යන්න පිළිබඳ "නීතියක්" නොමැත. | | |
| 8 | | ප්‍රශ්නාවලි රැස් කිරීම, ප්‍රතිචාර විශ්ලේෂණය | පැය 3 | දත්ත වලින් ලබා ගත් තොරතුරු මා ඉදිරිපත් කරන්නේ කෙසේද? |
| 9-12 | ඇගයීම | අමතර පොත පත කියවීම අඛන්ඩව පවත්වාගෙන යාම, අදාල සියළු තොරතුරු රැස්කිරීම, පර්යේෂණ වාර්ථාව ලිවීම | | |

(Taylor et al., 2006:9)

පර්යේෂණ යෝජනාව සඳහා ආකෘතිය

1. පර්යේෂණයේ මාතෘකාව

2. ගැටළුව හැඳින්වීම

   පසුබිම, පාසල ආශ්‍රිත තොරතුරු පදනම් කරගෙන ගැටළුව හඳුනාගත් ආකාරය

3. ගැටළුව ආශ්‍රිත සාහිත්‍යය විමර්ශනය
   පුස්තකාලය ආශ්‍රිත තොරතුරු පාදක් කර ගෙන සමාන ගැටළු විසඳීම සඳහා පර්යේෂකයන් විසින් යොදා ගෙන ඇති ක්‍රියා මාර්ග විමර්ශනය කිරීම.

4. පර්යේෂණ අරමුණු හා පර්යේෂණ ප්‍රශ්න
   පර්යේෂණයේ ප්‍රධාන අරමුණ හා ඊට ළඟාවීමට ඉටුකරගතයුතු සුවිශේෂී අරමුණු හෝ පර්යේෂණ ප්‍රශ්න.

5. ගැටළු විසඳීම සඳහා යෝජිත ක්‍රියා මාර්ග හා අනුගමනය කිරීමට අපේක්ෂිත ආචාරධර්ම.

   සාහිත්‍ය විමර්ශනයෙන් හා ගැටළුවට සම්බන්ධ පාර්ශව හා වෙනත් දත්ත රැස්කිරීමේ ක්‍රම මගින්, (ඔබේ වෘත්තීය අත්දැකීම්, නිරීක්ෂණ) ඔබ ලබා ගත් තොරතුරු මෙන්ම ප්‍රත්‍යාවේක්ෂණය තුලින් ගැටළුව විසඳීම සඳහා යොදා ගත හැකි ක්‍රියා මාර්ග හඳුනා ගන්න.

   මෙහිදී පර්යේෂණ ජ'නලය/ ක්ෂේත්‍ර සටහන්, නිරීක්ෂණ පත්‍රිකා, සම්මුඛ සාකච්ජාවලින් ගනු ලබන තොරතුරු ඔබට ප්‍රයෝජනවත් වනු ඇත.

( අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය, 2010)

**කාර්ය මූලික පර්යේෂණක්‍රමවේදය පිළිබඳව පර්යේෂකයන්ගේ ඇසින්.....**

කාර්යය මූලික පර්යේෂණය, ගුරුවරුන්ගේ වෘත්තික දැනුම දියුණු කිරීමට යොදාගත හැකි අයුරු අත්හදා බැලීමට අවස්ථාවක් වසර ගණනාවකට පෙර මා හට ලැබිණි. ගුරුවරුන් එදිනෙදා පන්ති කාමරයේදී මුහුණපාන ගැටළුවක් නිරාකරණය කරගැනීමේ අරමුණින්, ගුරුවරයා විසින්ම සැලසුම් කර දියත් කරන විසඳුම් මාලාවක් මෙම පර්යේෂණ ක්‍රියාවලියට ඇතුළත්ය. ගැටළුවක් හඳුනාගැනීම, ඒ පිළිබඳ විශ්ලේෂණය කිරීම, සුදුසු විසඳුම් හඳුනාගැනීම හා ඒවා එකින් එක ක්‍රියාත්මක කරමින් ඉන් ලැබෙන ඵල ඇගයීම, ඒ අනුව නව විසඳුම් වල අඩුපාඩු මඟහරවා ගනිමින් නව විසඳුම් ක්‍රියාත්මක කිරීම ආදී වශයෙන් වූ සර්පිලාකාර ක්‍රියාවලියක් මෙහිදී අනුගමනය කෙරේ. මෙහිදී සුවිශේෂ වැදගත්කමක් ගන්නා ක්‍රියාවලියක් වන්නේ තමන්ගේ ක්‍රියාකාරිත්වය, නැතහොත් තමන් ක්‍රියාත්මක කරන විසඳුම් හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳ නැවත සලකා බැලීම නැතහොත් ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලියයි. ගුරුවරයාගේ වෘත්තික දැනුම, දියුණුව සඳහා මූලික වන්නේ මෙම ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලියයි.

ඉගැන්වීම, ඉගෙනුම් අවස්ථාවේ ස්වභාවය අනුව හැඩගස්වා ගැනීමේ හැකියාව වැඩිදියුණු කරගැනීමට මෙම ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලිය ඉතා ප්‍රයෝජනවත් වේ. කාර්ය මූලික පර්යේෂණ නියැලීම හඳුනාගත් ගැටළුව නිරාකරණය කිරීම සඳහා නව මංපෙත් හඳුනා ගැනීමට මෙන්ම ගුරුවරයාගේ ප්‍රත්‍යවේක්ෂණ හැකියාව දියුණු කිරීමට ද හේතුවන බව මගේ අත්දැකීමයි.

Wijesundara, S. 9002) School Improvement : an action – based case study conducted in disadvantaged school in Sri Lanka, *Educational Action Research*, 10 (2), pp 169-188

සුභාෂිනී විජේසුන්දර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය

"නවක උපාධිධාරී ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය තුළින් පාසල් වර්ධනය කිරීම" යන තේමාව යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය විසින් වර්ෂ 2008, 2009 හිදී දියත් කරන ලද කාර්යමූලික පර්යේෂණයට සහභාගි වූ පර්යේෂිකාවක් වශයෙන් මෙම පර්යේෂණය මා දකින ආකාරය, ඉන් ලද අත්දැකීම් කෙටි සටහනකට හැඟීම ඉතා අපහසු කාර්යයකි. එනමුදු මෙම උත්කෘෂ්ට කාර්ය මා මනසේ පින්තාරු වූ ආකාරය මෙසේ කැටිකොට දැක්වීමට අදිටන් කළෙමි.

අපගේ පර්යේෂණ භූමිය, මප / හස / තෙල් / පිල්හත මහ විදුහලය. එහි පැමිණි මුල් දිනයේ පටන් මේ දක්වා පාසලේ විදුහල්පති නවක උපාධිධාරී ගුරු සිසුන්, සෙසු ගුරු මණ්ඩලය, සිසු සිසුවියන්, මෙන්ම පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය මේ සියළුම දෙනා පර්යේෂණයේ තවමත් රැඳී සිටිති. එතරම් දිගු ගමනක් යාමට තරම් මෙම පර්යේෂණය ප්‍රබල වූයේ අප කණ්ඩායමට එක් වූ වෝල්ටර් සෙනෙවිරත්න මහතා ඇතුළුව මේ සියළුම දෙනා මානව සමාජ සම්පත් වූ හෙයින් යැයි මා සිතමි.

විදුහල්පතිතුමාගේ කාරුණික මඟ පෙන්වීම සමඟ නවක උපාධිධාරී ගුරු මණ්ඩලයේ සෑම ගුරු භවතෙක්ම පාසලේ විවිධ කටයුතු සඳහා කැපවන බව දැකගත හැකිවිය. මේ නිසාම පාසලට පැමිණි මුළු දිනයේදීම කාර්යමූලික පර්යේෂණයට උචිත පසුබිමක් නිර්මාණය විය. ඒ අනුව ශිෂ්‍යයින්ගේ සාක්ෂර දුෂ්කරතා මඟ හැරවීම සහ සදාචාරාත්මක බව වර්ධනය කිරීමට කාර්යමූලික පර්යේෂණ දියත් වියයුතු බවට යෝජනා විය. මේ නිසා කාර්යමූලික පර්යේෂණ ක්‍රමයට ගැළපෙන අන්දමට ස්වභාවික පරිසරය තුළින් වෘත්තීය අවලෝකනයට යටත්ව සැබෑ ගැටළු දෙකක් නිර්මාණය වීම නිරායාසයෙන්ම අප වාසනාවන්ත පිරිසක් බව හැඟී යාමට හේතුවක් විය.

පර්යේෂණ කටයුතු කෙරීගෙන යන අතරතුර පැවැත්වූ සම්මන්ත්‍රණ පර්යේෂණය පිළිබඳ න්‍යායාත්මක අවබෝධය පුළුල් කිරීමට හේතුවක් විය. ක්ෂේත්‍රයේදී මුණු ගැසුණු ගැටළු නිරාකරණය කර ගැනීමට එය අප කාහටත් මඟ පෙන්වීමක් විය. තවද මූල්‍ය දීමනා සහ ආහාරපානාදියෙන් කළ සංග්‍රහ

කිරීම් තුළ අප ලද අනුග්‍රහයත් පර්යේෂණ කාර්යය අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට අනුබලයක් වූයේ යැයි මා සිතමි.

ආරම්භයේදී ගැටලු දෙකක් ලෙස සනිටුහන් වුවද පසුව අප සියල්ලම සාක්ෂර දුෂ්කරතා මඟහරවාලීම පිළිබඳ වූ කාර්යමූලික පර්යේෂණයට යොමුවීමට එකඟතාවක් ඇතිකර ගත්තෙමු. එම ප්‍රවේශ්‍ය තුළ පාසල පාදක කරගෙන මෙම පර්යේෂණය අඛණ්ඩව කරගෙන යාමට පහසුවක් විය.

තවද ශිෂ්‍යයින්ගේ සදාචාරාත්මක සංවර්ධනය ආශ්‍රිතව ගුරුවරු කරන ලද මැදිහත්වීම පාදක කරගෙන වර්ෂ 2009 දී ඇමෙරිකාවේ චිකාගෝ නුවරදී " ළමුන්ගේ සදාචාරය සහ අධ්‍යාපනය යන තේමාව යටතේ පවත්වන ලද අන්තර්ජාතික සම්මන්ත්‍රණයට සහභාගි වී මෙම උත්සාහය යම්තාක් දුරකට ජාත්‍යන්තරයට ද ගෙනයාමට හැකිවිය.

නව උපාධිධාරීන් ගුරු වෘත්තියට ආධුනිකයින් වුවද තම පෞද්ගලික දුෂ්කරතාවන් පසෙකලා ග්‍රාමීය දුෂ්කර පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ට උපරිම සේවය ලබාදීම සඳහා කැපවීමට තරම් හිතෛෂී පිරිසක් වූහ. මේ අයට නිසි මඟ පෙන්වීමක් සිදුකිරීමෙන් ග්‍රාමීය පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කළහැකි බව සාක්ෂර බව වටහා ගතිමි.

සාක්ෂර බව පිළිබඳ විවිධ මට්ටමේ දුෂ්කරතා ඇති සිසුන් විශේෂිතව හඳුනාගැනීම, ඒ අයට උචිත පාඩම් නිර්මාණය කිරීම, ඒවා ඉගැන්වීම, සුදුසු ක්‍රමවේදයන් හඳුනා ගැනීමට තරම් දක්ෂ ගුරුවරු මේ පිරිස අතර විය. ඒ අනුව මෙම කාර්යමූලික පර්යේෂණ ගුරුවරුන්ගේ සැඟවුණු හැකියා රාශියක් මතු කිරීමට පමණක් නොව ඔවුන්ට ආත්ම විශ්වාසයකින් යුක්තව අධ්‍යාපන සංවර්ධන කාර්යයේදී සහභාගී කළහැකි පිරිසක් බව හැඟුණි.

පාසලේ විදුහල්පති මෙම කාර්යයට පූර්ණ සහයෝගය දක්වන්නෙක් විය. ඒ අනුව මෙබඳු වැඩ සටහන් පාසල පාදක කළමනාකරණ සංකල්පය සාර්ථක කරගැනීමට ඉමහත් පිටුවහලක් වූ බව දනිමි.

ශිෂ්‍යයින්ගේ සාක්ෂර දුර්වලතා අවම කිරීම සඳහා ගුරුවරුන් මෙහෙයවන ලද විවිධ වැඩ සටහන් තුළ සිසුන්ගේ සාක්ෂර කුසලතා, සමාජීය හා

චිත්තවේගික කුසලතා සංවර්ධනයක් වූවා යැයි සිතේ. පාසලේ මුල් ගැන්වී සිටි බොහෝමයක් සිසුන් පාසල් වේලාවෙන් පසුව සාක්ෂරතා වැඩ සටහන්වලට උද්යෝගිමත්ව සහභාගි වීම, නොකඩවා පන්තිවලට සහභාගි වීම මෙයට කදිම නිදසුනකි.

කාර්ය මුලික පර්යේෂණ ක්‍රමයෙන් ලද අත්දැකීම් ඔස්සේ සමහර ගුරුවරුන් කේවල ව්‍යාපෘති කාර්ය මුලික පර්යේෂණ උපාය මාර්ග ඔස්සේ දියුණු කිරීමට තරම් යොමුවී තිබුණි.

ආචාර්ය සුසිලා ඇම්බැක්ක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය

**2008/2009** දෙවසර තුළදී අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කළ කාර්යමූලික පර්යේෂණයේ මා හට පැවරුණු භූමිකාවන් ද්විත්වයකි.

එක් අතකින් පර්යේෂණයේ සම්බන්ධීකාරක ලෙසට පර්යේෂණය ආරම්භයේ සිට අවසන් වන තෙක් පර්යේෂණ නායකත්වය හා පර්යේෂක පර්යේෂිකාවන් සමග සුහදව කටයුතු කිරීමටත්, වැඩමුළු සංවිධානයටත්, වරින් වර සිදු වූ පර්යේෂණ ඉදිරිපත්කිරීම් සැලසුම් කිරීමටත් මා හට සුවිශේෂී කාර්යභාරයක් පැවරුණි.

අනෙක් අතින් පර්යේෂිකාවක් ලෙසටම පර්යේෂණ පරිශ්‍රයක් තුළ රැඳී සිටිමින්, පර්යේෂක, පර්යේෂිකාවන් සමග එහිදී කටයුතු කරමින්, සැබැවින්ම සිදුවන දේ නිරීක්ෂණය කරමින් එම තොරතුරු ඔස්සේ පර්යේෂණ ඉදිරි කටයුතු සැලසුම් කිරීමටත් සිදුවිණ.

මෙහිදී එක් අවස්ථාවක සම්බන්ධීකරණ සිදු කිරීමටත් තවත් විටෙක පර්යේෂිකාවක් ලෙසට කටයුතු කිරීමත් තුලින් මා ලද පුළුල් අත්දැකීම් සමුදාය මාගේ වෘත්තීය දිවියට රුකුලක් වනු නොඅනුමානය.

මීට අමතරව මා සිතන ආකාරයට මෙම පර්යේෂණයේ සුවිශේෂී වනුයේ මේ සඳහා නවක උපාධිධාරී ගුරුවරුන් සහභාගී වීමයි. ගුරු වෘත්තීයට පිවිසෙන නවකයින්ට පර්යෙෂණ පිළිබඳ මෙවැනි අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථා ඉතා විරල බැවින් මෙය ඔවුන් ලද භාග්‍යයක් කොට සැලකිය හැකිය.

ආචාර්ය පුෂ්පා විතාරණ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
(සම්බන්ධීකාරක කාර්යමූලික පර්යේෂණ 2008/2009)
අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය

අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශයේ මග පෙන්වීමට අනුව තෙල් / කොළොන්ගොඩ මහා විද්‍යාලය තවක උපාදිධාරී ගුරුභවතුන් සමඟ සහයෝගයෙන් කාර්ය මූලික පර්යේෂණය තුළින් සිසුන්ගේ ගණිත ගැටලුවලදී ගුණ කිරීමේ හා බෙදීමේ සංකල්පය වර්ධනය කිරීම සඳහා පර්යේෂණය දියත් කරන ලදී. මෙම පර්යේෂණය ක්‍රියාත්මක කිරීම තුළින් ලත් නිරීක්ෂණය හා අත්දැකීම් පිළිබඳව සමස්ත ප්‍රත්‍යාවේක්ෂණය තුළින් විද්‍යමාන වූ කරුණු කිහිපයක් දැක්විය හැකිය.

එහිදී පාසලක් තුළ කණ්ඩායමක් ලෙස සහයෝගී කාර්යයන් සඳහා පුද්ගලයන් පෙළඹවිය හැකි ආකාරය ඉගෙනීමට හැකිවීම ඉතා වැදගත් විය. එහිදී පාසල් ප්‍රමුඛතාවයන් හඳුනාගෙන එහ සංවර්ධනය කිරීමේ කාර්යයන්ට උරදීමට හැකිවිය. එහිදී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පෝෂණය කිරීමට අවශ්‍ය දැනුම් සම්භාරයක් ඇතිවිය. එහිදී ඉගැන්වීම් ක්‍රියාවලිය කවර ආකාරයෙන් සිසුන්ට බලපාන්නේද යන්න සොයා බැලීමට හා අනාවරණය කරගැනීමට හැකිවිය. තවද පර්යේෂණ ක්‍රියාවලිය තුළදී නව අදහස් සඳහා වඩා නම්‍යශීලී ලෙස ක්‍රියා කිරීමේ හා සිතීමේ හැකියාව ඇතිවිය.

අනෙකුත් පර්යේෂණ සමග සැසඳීමේදී කාර්ය මූලික පර්යේෂණ අනුබද්ධයෙන් ඇති සුවිශේෂ ක්‍රියාවලිය තුළ පර්යේෂණ ගැටලු, පර්යේෂණ අනාවරණ, පර්යේෂණ උපකරණ සැලම් කිරීම, පර්යේෂණ දත්ත විශ්ලේෂණය පිළිබඳව හඳුනාගැනීමට හා හැකියාව වර්ධනය කරගැනීමට හැකිවිය.

මෙම පර්යේෂණය තුළින් ගුරු සංවර්ධන කාර්යයේදී ගුරු පුහුණු උපදේශන හැකියාව, ගුරු අධ්‍යාපනඥයන් වශයෙන් වෘත්තීය දියුණුවත්, වෘත්තීය සගයන් සමඟ සහයෝගීව වැඩ කිරීමේ හැකියාව, ඉගෙනුම් සමාජ යන විවිධ වෘත්තිකයන් සමඟ සම්බන්ධවීම වෘත්තිය සදාචාරය වර්ධනය වීම ද සිදුවිය.

ප්‍රභාත් ඒකනායක
කථිකාචාර්ය
අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය

අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව මගින් අධ්‍යාපනපති පාඨමාලාව, පශ්චාත් උපාධි ඩිපලෝමා පාඨමාලාව, ශාරීරික අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ඇතුළු පාඨමාලාවල කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව න්‍යායික දේශන හා කාර්යමූලික පර්යේෂණ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කාලයක් තිස්සේ කරගෙන යන කාර්යයකි.

එහිදී අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය වරයෙකු වශයෙන් එවැනි පාඨමාලාවල දේශන පැවැත්වීම හා පර්යේශණ නිබන්ධන උපදේශකයෙකු වශයෙන්, නිබන්ධ ඇගයුම් කරුවෙකු වශයෙන් භූමිකාව ඉටුකරන්නට සිදුවිය. මෙහිදී මීට පෙර කාර්යමූලික පර්යේෂණ පිළිබඳව මා සතුව න්‍යායික දැනුම් ක්ෂේත්‍රයේ ස්වල්ප දැනුමක් සහිතව අභියෝගයක් ලෙස එම කාර්යය ඉටුකරන ලදි.

නමුත් අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙම කාර්ය මූලික පර්යේෂණය සැබෑ ලෙසම නිරත වීම සඳහා මා හට අවස්ථාවක් ලබාදීම තුළින් එම කාර්යය ඉගැන්වීම හා සම්බන්ධ කිරීම සඳහා ඉතා විශාල පිටුවහලක් මෙම පර්යේෂණය තුලින් මා හට ලැබුනි. එහිදී කථිකාචාර්ය මණ්ඩලය සඳහා දෙස් විදෙස් ප්‍රවීණයන් හමුවේ වැඩමුළු (WORKSMART PROGRAMME) සංවිධානය කිරීම මා ඉතා වැදගත් කොට සලකන අතර එමගින් කාර්ය මූලික පර්යේෂණ පිළිබඳව විශාල දැනුම් සම්භාරයක් ලැබින.

පිල්හත මහා විද්‍යාලයේ ගුරුවරු 17 ක් සමග සහයෝගී (collaborative) කාර්ය මූලික පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීම සඳහා දායක වීමට ලැබීම කථිකාචාර්යවරයකු වශයෙන් මගේ වෘත්තීය සංවර්ධනයට ඉතා වැදගත් අවස්ථාවක් විය.

ගුරු අධ්‍යාපඥයින් වශයෙන් අපගේ දැනුම හුදෙක් න්‍යායික ක්ෂේත්‍රයට පමණක් සීමා නොවිය යුතුය. මෙවැනි ප්‍රයෝගික අත්දැකීම් වලට යොමුවීම තුලින් වත්මන් පාසල් පද්ධතියේ ගැටළු පිළිබඳව සැබෑ අත්දැකීමක් අපට ලැබුණි.

අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය විය යුත්තේ ක්ෂේත්‍රයේ මෙවැනි ගැටළු සඳහා සැබෑ මැදිහත්වීමක් සිදු කිරීමයි.

නැත්නම් අප හුදු න්‍යායික දැනුම පමණක් ලබාදෙන්නවුන් බවට පත්විය හැක.

ගුරුසිසුන්ගේ කාර්ය මූලික පර්යේෂණ වලදී උපදෙස් දීම හා ඇගයීම් කාර්යය නිසි ලෙස ඉටු කිරීම සඳහා වඩා සාධාරණ හා උසස් අත්දැකීම් එම කාර්යය කිරීම සඳහාත් මෙම කාර්යමූලික පර්යේෂණයෙහි නිරත වීම බෙහෙවින් ඉවහල් විය.

කාර්යමූලික පර්යේෂණ ක්‍රියාවලිය සම්බන්ධව ආපසු හැරී බලන විට ක්ෂේත්‍රයේ දී ලද නිරීක්ෂණ ඇසුරින් ප්‍රත්‍යාවේක්ෂණය වූ කරුණු පහත ආකාරයෙන් දැක්විය හැකිය.

කාර්යමූලික පර්යේෂණය යනු වෘත්තිකයින් ලෙස එදිනෙදා මුහුණ දෙන කාර්ය සංවර්ධනය කිරීම සඳහා තමා විසින් තමාගේ කාර්යයන් දෙස බලමින් එම ගැටළු විසඳීම කොතෙක් දුරට ඉටුවූවාදැයි තක්සේරුකරණයද තමන් විසින්ම දරමින් කරනු ලබන්නාවූ පර්යේෂණයක් බව එහිදී පසක් විය.

කාර්යමූලික පර්යේෂණය පිල්හත මහා විද්‍යාලයේ ක්‍රියාත්කම කිරීම තුලින් නවක උපාධිධාරී ගුරුවරුන්ට පාසල් වල නිසි මඟ පෙන්වීම අවම මට්ටමේ පවතින බව දැනුණි. එහිදී වෘත්තීය වශයෙන් පංතිකාමර ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව ඔවුන් ඉතාම හැකි ඉක්මනින් පද්ධතිය තුලද දැනුවත් වීම් සිදුවිය යුතු බව හැඟුණි. නවකයින් වශයෙන් ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ධනාත්මක සිතුවිලි/ආකල්ප ඇති බවත් පෙනී ගිය කරුණකි.

අප විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යමූලික පර්යේෂණය පිළිබඳව සහයෝගී භූමිකාවක් ඉටුකරන ලද බව සතුටින් සඳහන් කරමි. කෙසේ වුවත් සමහර නවක උපාධිධාරී ගුරුවරුන්ට අප විසින් කාර්ය මූලික පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව අවබෝධය හා දක්ෂතා වර්ධනය කිරීමට දරණ ලද ප්‍රයත්නය පිළිබඳ නිවැරදි සංජානනයක් ඇති නොවූ බවද දක්නට ලැබුණි. කාර්යමූලික පර්යේෂණ ක්‍රමවේදය පාසල් පාදකව ගුරු සංවර්ධනය කිරීමේදී සැලකිය යුතු සුවිශේෂී අංශයන් ලෙසද අපට හඳුනාගත හැකිවිය. එය අවසාන වශයෙන් පාසල ප්‍රවර්ධනය (School Improvement) සඳහා සෘජුවම දායක වන බව පෙනුනි. සුවිශේෂීව ගත්විට

සාක්ෂරතා සංවර්ධනයේදී CLE(Concentrated Language Encounter) ක්‍රමය ඉතාම ඵලදායී ක්‍රමයක් බව ප්‍රත්‍යක්ෂ විය.

වෝල්ටර් සෙනෙවිරත්න
කථිකාචාර්ය
අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මෙන්ම අනෙක් ක්ෂේත්‍ර තුළ ද කාර්යමූලික පර්යේෂණ මඟින් ඉතා ම ඵලදායී ප්‍රතිඵල ලබාගත හැකිය. ගුරුවරයෙක් තම ශිෂ්‍ය සාධන මට්ටම් වර්ධනය කිරීම සඳහා කාර්යමූලික පර්යේෂණයක් සිදු කරනවිට එහි ප්‍රතිඵල ලෙස තමාට ඒ පිළිබඳව සතුටක් ඇතිවේ. වෙනත් ගැටලුවලට විසඳුම් සෙවීමට පෙළඹෙයි. අළුත් අත්දැකීම් ලබාගනී. ඒවා ක්‍රියාත්මක කරයි. මේ පිළිබඳ මිතුරු ගුරුවරු සමඟ කථා කරයි. මෙහි සාර්ථකත්වය ඔවුන්ට පෙන්වා දෙයි. එවිට එම ගුරුවරු ද ඔවුන්ගේ ගැටලුවලට විසඳුම් ලබාගැනීමට කාර්යමූලික පරීක්ෂණ සිදුකරයි.

විවිධ ගුරුවරු කරන ලද කාර්යමූලික පරීක්ෂණ නිරීක්ෂණය කිරීමෙන් පෙනීයන්නේ ඉගැන්වීම සඳහා විවිධ ක්‍රම යොදාගන්නා බවත්, ශිෂ්‍යයින් තුළ ඉගෙනුම් ඉලක්ක ඇතිකරන බවත්, ශිෂ්‍යයින්ට බොහෝ අනුකරණ අත්දැකීම් ලබාදෙන බවත්, ශිෂ්‍යයින් ධෛර්යයමත් කරන බවත්ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍යයින්ට ඉගෙනීම සඳහා කැමැත්තක් ඇතිවේ, විශ්වාසයක් ඇතිවේ. බිය නැතිවේ. ශිෂ්‍යයින් ඉලක්ක ඇතිකරගෙන ඉහළ සාධන මට්ටම් පෙන්නුම් කරයි. මෙම ශිෂ්‍යයින් තුළ විශේෂ වර්ධනයක් දකින අනෙක් ශිෂ්‍යයින්ද සිය කැමැත්තෙන් කාර්යමූලික පර්යේෂණ කණ්ඩායම්වලට එකතු වේ. දූ දරුවන්ගේ සාධන මට්ටම්වල වෙනසක් දකින් දෙමව්පියන් සතුටට පත් වී ඒ බව ප්‍රකාශ කරයි. කාර්යමූලික පර්යේෂණවල ප්‍රතිඵල නිරීක්ෂණය කරන විදුහල්පතිවරුන් තම පාසල තුළ විවිධ ගැටලු විසඳීම සඳහා කාර්යමූලික පර්යේෂණ සැලසුම් කර ඒවා ක්‍රියාත්මක කරයි. ප්‍රතිඵල ලබාගනී. කාර්යමූලික පර්යේෂණ සිදුකිරීම මඟින් සමස්ත පාසල් පද්ධතිය තුළ ඇති ගැටලුවලට විසඳුම් සෙවිය හැකිය. කාර්යමූලික පර්යේෂණවල ප්‍රතිඵල ලෙස ගුරුවරු හා ශිෂ්‍යයින් අතර ද, ගුරුවරුන් හා දෙමව්පියන් අතර ද, ගුරුවරුන් - ගුරුවරුන් අතර ද, ගුරුවරුන් හා විදුහල්පති අතර ද පැහැදිලි අන්තර් සම්බන්ධතාවයක් ඇතිවේ.

ගාමිණී මැදගෙදර
බාහිර කථිකාචාර්ය
අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය

## ආශ්‍රිත ග්‍රන්ථ


Cohen. L, Mahion, L. and Morrison, K. (2000) *Research Methods in Education*. London: RoutedgeFalmer.

Carr, W. and Kemmis, S. (1986) Becoming Critical; *Education Knowledge and Action Research*. Lewes: Falmer.

Taylor, C., Wilkie, M. and Baser, J. (2006) *Doing Action Research; A Guide for School Support Staff*. London: Age.

Freeman, D. (1998) *Doing Teacher Research*. London: Heinle and Heinle.

McNiff, J. and Whitehead, J. (2002) *Action Research: Principals and Practice* (2nd edn). London: RoultedgeFalmer.

McNiff, J. and Whitehead, J. (2005) *Action Research for Teachers: A Practical Guide*. London: David Fulton.

Kember, D. (2000) *Action Learning and Action Research: Improving the quality of teaching and learning*. London: kogan page.

Gary, D. (2004) *Doing Research in the Real World*. London: Sage.

Shumuck, R.A. (2009) *Practical Action Research*. California: Corwin

Sehon, D.A. (1983) *the Reflective Practitioner* London: Temple Smith.

කොඩිතුවක්කු, ගොඩ්වින්. (1996) කාර්යමූලික පර්යේෂණ ප්‍රවේශය : අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සඳහා ඉඟි සමූහයකි, සූනෙර ප්‍රකාශන.